# ප්‍රවෘත්ති නිවේදනය


බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාරර්යාලය
மேல் மாகாண மாகாண சபை செயலகம்
Secretariat of the Western Province Provincial Council

5 වන මහල, බී පරර්යන්තය,සෙත්සිරිපාය, බත්තරමුල්ල. 5ஆம் மாடி, B அலகு, செத்சிறிபாய, பத்தரமுல்லை. 5 th Floor, Wing B, Sethsiripaya, Battaramulla.


## එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් බස්නාහිර පළාත් සභාවට මොහම්මදු සලීම් සකාවුල්ලා මහතා පත්වේ.

බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික් ගරු පළාත් සභා මන්ත්‍රී ආනන්ද රංජිත් රූපසිංහ මහතා අභාවප්‍රාප්ත ඔමෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මොහම්මදු සලීම් සකාවුල්ලා මහතා පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්ව සිටි.

එලෙස තේරී පත් වූ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පළාත් සභා මන්ත්‍රී මොහම්මදු සලීම් සකාවුල්ලා මහතා ඊයේ (2015.11.16) දින පෙරවරුවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය කාර්යාල සංකීර්ණයේ 05 වන මහලේ පිහිටි බස්නාහිර පළාත් සභා ලේකම් කාර්යාලයේදී බස්නාහිර පළාත් සභාවේ සභාපති සුනිල් විජේරත්න මහතා ඉදිරියේදී පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දුන් අවස්ථාව ඡායාරූපයේ දැක්වේ.

මෙම අවස්ථාවට ජාතික ඒකාබද්ධතා රාජ්‍ය අමාත්‍ය ඒ.එච්.එම්. ෆවුසි, ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා සහ බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ යන මහත්වරුන් සහභාගි වූහ.

(ඡායාරූපය ඇමුණුමක් ලෙස මේ සමඟ ඇත.)

---

ඉහත ප්‍රවෘත්තිය සත්‍ය ප්‍රවෘත්තියක් බවට සහතික කරමි.

සී.ඒ. අප්සරා,
පරිපාලන නිලධාරි (රා.ආ.)
ලේකම් වෙනුවට,
බස්නාහිර පළාතේ පළාත් සභාව

දිනය: 2015.11.16


දුරකථන / தொலைபேசி / Telephone — කාරර්යාලය / காரியாலயம் / Office: 2886462, 2886459 — ලේකම් / செயலாளர் / Secretary: 2886454, 2886456 (Fax)

ඊමේල් secretarywppc@sltnet.lk